## 2018 ජූලි මස සාංඝික පවුල් දින සුපුවත
## 'ආලේපිත හදත්, ආලේපිත මුවත්, ආලේපිත දෙතොලත් ශුද්ධාත්ම ගින්නට හසු වූ මොහොතක බිහිවූ නවෝදයක්'

01. ආරම්භක ප්‍රශංසාව :

පුබුදු ගී අංක 02 "නමෝ නමෝ....."

02. ප්‍රශංසාවට හැඳින්වීම :

**"ඔබ වහන්සේගේ වචනය ද, කැමැත්ත ද ගින්නකි; ආශිර්වාදයකි"**

2018 වසරේ ශුද්ධාත්ම මංගල මහෝත්සව රාත්‍රියේදී පුබුදු ජනතාවක් වන අපට ලැබුනු තේමාව මොන තරම් නම් බලගතුද? දෙවියන් වහන්සේගේ හදවතෙහි තැනක අපව තබාගෙන දක්වන්නාවූ ආදරය කොතරම් පුදුම සහගතද? අරගලය, වේදනාව, තනිකම, එපාවීම, කනස්සල්ල, බලාපොරොත්තු සුන්වීම ... මේ සියල්ල තුළ දෙවියන් වහන්සේට ප්‍රශංසා කිරීමේ තෑග්ග ඔවුන් වහන්සේගේ ආශිර්වාදයක් ලෙස අත්දකින්නට අපට ලැබී ඇති වරම කිසිවෙකුට ලැබී නැත. මේ මොහොතේදී අපි අත්දකින සියළු තත්ත්වයන් තුළම දෙවියන් වහන්සේගේ ආශිර්වාදය අප වෙතට ගලා එන අයුරු දකිමින්, සියල්ලේදීම යහපත පිණිස ක්‍රියා කළහැකි දෙව් මහෝත්තමයාණන්ට ප්‍රශංසා කරමු.
පුබුදු ගී අංක 146 "අභිරහසක් කරදා ...."

03. දවසේ සුපුවත - i වන කොටස

47 වසරක පුබුදු ඉතිහාසය තුළ දෙවියන් වහන්සේ පුබුදු ජනතාවට අනාවරණය කර ඇති දේව ප්‍රේමයේ අභිරහස්, ජීවිත ක්‍රමයක් වෙත ඔවුන් රැගෙන ගොස් ඇති බව ඒ දෙස බලන සෑම දෙනෙතකටම ඉතා සුපැහැදිලිව දිස් වෙයි.

සෑම වසරකම දිගහැරෙන තේමාව දෙවියන් වහන්සේගේ ශ්‍රී වචනය, ඔවුන් වහන්සේගේම ආලේපිත මුවින් ප්‍රකාශ වූයේ එහි බහුල ආශිර්වාදය ජනතාවගේ ජීවිත දේව ප්‍රේමය වෙතට නතු කරමිනි. එය පුදුම සහගතවූ ද, විශ්ම ජනක වූද අනාවරණයකි.

කෙසේ ආරම්භ වූයේද, කවදා ආරම්භවීද, කවුරුන් විසින් ආරම්භ කරන ලද්දක් ද යන්න අභිරහස්මක වූ කිතු දන පුබුදුව සමිඳාණන් වහන්සේගේම සෙවරි කැමැත්ත මත බිහිවූවක් වීම එය දේව සැලැස්ම මතම ක්‍රියාත්මක වූවක් බව අපට සනාත කර පෙන්වයි.

* ලෝකය මැවීමට පෙරම දෙවියන් වහන්සේගේ සිතෙහි කිතු දන පුබුදුව පිළිබඳ මැවුනු සිහිනය, චිත්‍රය ඔවුන් වහන්සේගේම සිතැගියාවන් මත නිර්මාණය කරන්නට තෝරාපත් කළ කලාකරුවා, නිමැවුම්කරුවා, දායකයා, ආලේපිත හදක්, ආලේපිත මුවක්, ආලේපිත දෙතොලක් සහිත ශුද්ධාත්ම ගින්නට නතුවූවකු බව කිතු දන පුබුදුව දෙස බලා සිටින සැමගේ නිගමනයයි.

* 2018 වසර ශුද්ධාත්ම ආගමන මංගල මහෝත්සවයේදී අප ලද තේමාව "ඔබ වහන්සේගේ වචනය ද, කැමැත්ත ද ගින්නකි; ආශිර්වාදයකි" මෙවන් වදන් නික්මෙන්නේ ආලේපිත මුවකිනි. ආලේපිත හදකිනි. එහි ආශිර්වාදය තේමාව ඇසුනු මොහොතේ සිටම ජනතාවගේ ජීවිත තුළට බලපා ඇති අයුරු විස්තර කළ නොහැකි තරම්ම ප්‍රබලය. එදින මංගල රාත්‍රියේදී අනුරාධපුර රදගුරුතුමන්ගේ දේශනය තුළින් දිගහැරුණු දෙවියන් වහන්සේගේ ශ්‍රී වචනය ඊට සාක්ෂි දරයි.

**ඔබ වහන්සේගේ වචනය ද .....**

ශුද්ධවූ බයිබලය තුළ අනාවරණය වන පරිදි දෙවියන් වහන්සේගේ වචනයට සවන් දුන්, දේව වචනයට අවනතවූ, දේව වචනය තුළ ජීවත් වෙමින් එහි ආශිර්වාදය අත්දුටු දේව අම්මාගේ අත්දැකීම ජේසු සමිඳාණන්ගේ අත්දැකීම මොනතරම් නම් භාග්‍යවන්ත දැයි අපට අනාවරණය කරයි.

උදා: i ශු.ලූක් 11:27-28 වගන්ති තුළ සමිඳාණන් වහන්සේ ශ්‍රී වචනය උගන්වමින් සිටි අවස්ථාවේදී එහි සිටි එක්තරා කාන්තාවක් ප්‍රකාශ කරන වචනය දේව වචනයට සවන් දීමෙන්, දේව වචනයට අවනත වීමෙන් ලද ආශිර්වාදය පැහැදිලි කරයි.

**"ඔබ දැරූ කුසය ද, ඔබට කිරි දුන් පියයුරුද භාග්‍යවන්තය"**

එයට පිළිතුරු දුන් සමිඳාණන් වහන්සේගේ ප්‍රකාශය තුළද දේව වචනය පිළිපදින අය භාග්‍යවන්ත බව, ආශිර්වාදිත බව ප්‍රකාශ වෙයි.

**"එසේය දෙවියන් වහන්සේගේ වචනය අසා එය පිළිපදින අය ඊටත් වඩා භාග්‍යවන්තය"**

ii ශු.ලූක් 8:19-21 දෙවියන් වහන්සේගේ වචනය පිළිපැදීමේ භාග්‍යවන්තකම.

iii යෙසායා 55:10-11 දේව වචනය ජීවමානයි, ක්‍රියාශීලියි. එය අත්දකින අය භාග්‍යවන්තය.

iv ශු.ලූක් 8:4-15 වපුරන්න්ගේ උපමාව තුළද දේව වචනයේ එල දැරීම ගැන මතක් කර දෙමින් දේව වචනයට සවන්දීම තුළ, ජීවත් වීම තුළ ලැබෙන ආශිර්වාදය අපට උගන්වයි. මෙලෙස මුළු ශුද්ධවූ බයිබලය තුළම අනාවරණය වන දේව වචනය ගින්නක්. එහි ආශිර්වාදය ජීවිතයට බලයක් බව අත්දකින්නට මේ වසරේ අපව කැඳවනු ලබයි.

**ඔබ වහන්සේගේ කැමැත්ත ද ....**
දෙවියන් වහන්සේගේ කැමැත්ත තම ජීවිතය පුරාම ඉටුකළාවූ සමිඳාණන් වහන්සේගේ ජීවිතය මොනතරම් නම් ආශිර්වාදාත්මක දැයි ශුද්ධවූ බයිබලය අපට උගන්වයි.

* සමිඳාණන් වහන්සේව මනුෂ්‍යයෙකු ලෙස මෙලොවට එවීමට දෙවියන් වහන්සේ තීරණය කළ මොහොතේ සිටම කපාල කඳු මුදුනේ කුරුසියේ ඇණ ගැසුම් කා මරණයට පත් කිරීම දක්වාද එතැනින් නොනැවතී මරණය පරාජය කරමින් උත්ථාන වීම දක්වාම දේව කැමැත්ත අප සමිඳාණන් වහන්සේගේ ජීවිතයේ ප්‍රකාශ වූ අයුරු දේව කැමැත්ත ඉටුකිරීම ගින්නක්, ඒ වගේම එය ආශිර්වාදයක් බව අනාවරණය කරයි.

* දේව කැමැත්ත ඉටු කරන්නට නම් :
  අත්හරින්නට සිදුවෙයි.
  හිස්වෙන්නට සිදුවෙයි.
  දෙවියන් වහන්සේ තුළ යැපෙන්නට සිදු වෙයි.
  දේව සිත විමසන්නට සිදු වෙයි.
  දේව වචනයට අවනත වෙන්නට සිදු වෙයි.

ක්‍රිස්තුන් වහන්සේගේ ජීවිතයේ උපතේ සිට මරණය දක්වාම අත්හැරීමේ හිස්වීමේ ගමනක යෙදුනු ඔවුන් වහන්සේ පූර්ණව පියාණන් වහන්සේ තුළ යැපෙමින්, දේව සිත විමසමින්, දේව වචනයට අවනත වුනු අත්දැකීම උත්ථානයයි. ආශිර්වාදය අත්දකින්නට මෙන්ම මුළු ලෝකයේම ගැළවීමේ ආශිර්වාදය ලබන්නට හේතු වූ බව අපට දැකගත හැකිය.

| | | |
|---|---|---|
| උදා: | පිලිප්පි 2:6-11 | අත්හැරීමේ / හිස්වීමේ ජීවිත |
| | ශු.මතෙව් 6:25-34 | දෙවියන් වහන්සේ තුළ යැපීමේ ජීවිතය |
| | ශු.ලූක් 6:12-13 | ප්‍රේරිතයන් 12 දෙනා තෝරා ගැනීමට දේව කැමැත්ත විමසීම |
| | ශු.ලූක් 23:46 | දේව වචනයට, කැමැත්තට අවනත වීම. |

04. සාකච්ඡාව සඳහා : (4 දෙනාගේ පුංචි සංඝයන් තුළ)

i වසර 47ක් පුරා අප ආ පුබුදු ජීවිත ගමන තුළ ඔබත් එක් සාමාජිකයෙකි. වසරින් වසර අපට ලැබෙන තේමාව ජීවත් කරවන්නට අප කොතෙක් නම් අවදියෙන් සිටියාද?

ii 2018 වසර ශුද්ධාත්ම ආගමන මංගල මහෝත්සවයේ තේමාව,"ඔබ වහන්සේගේ වචනය ද, කැමැත්ත ද ගින්නකි; ආශිර්වාදයකි" එහි ගැඹුර, එහි බලය අත්දකින්නට ඔබ තුළ ශුද්ධාත්ම ගින්න ඇවිළුනාද?

iii පසුකලාවූ මාසයකට වඩා වැඩි කාලය තුළ "වචනය සෙවීමට" අවදි වුනාද? ඒ පිළිබඳව අත්දැකීම බෙදා ගන්න.

iv ශුද්ධාත්ම ගින්නට හසුවූවකු ලෙස අප ජීවිත තුළින් ප්‍රකාශ වූ සරල අල්පේච්ඡ ජීවිතය ජීවිතයෙන් පිළිබිඹු වූයේදැයි සිතා බලන්නට, මනස්ථාපනය වෙන්නට ඔබට හැකිවීද?

v අනුරාධපුර පදවි රදගුරුතුමා අපට මතක් කළා,'ශුද්ධාත්මයාණන් වහන්සේගේ වරප්‍රසාදය ලත් සෙනඟක් ලෙස, විෂමකාරි වූ සමාජය සුවදායි තැනක් කරන්නට, මේ දේශයට ආශිර්වාදයක් වන්නට අපට විශේෂ කැඳවීමක් තිබෙන බව'

- ඊට අවදි වන්නට ඔබට හැකි වූවාද?
- යම් පියවරක් තබන්නට ඔබට හැකිවීද?

ii වන කොටස

පුබුදු ජනතාවක් ලෙස අප ආරම්භ කළාවූ නව වසර ශුද්ධාත්ම ආගමන මංගල මහා රාත්‍රිය අපේ ජීවිත වෙතට ආලෝකය, බලය, ආශිර්වාදය නොඅඩුව ගලා ආ රාත්‍රියකි. දෙවියන් වහන්සේගේ අසීමිත ප්‍රේමය අපට දානය කළාවූ ශුද්ධවූ රාත්‍රියකි. ප්‍රීතිය, නිදහස, ආනන්දය අප හදවත් තුළ ජනිත වූ රාත්‍රියකි. දෙව් මහෝත්තමයාණන් වහන්සේ පුබුදු ජනතාවම මහිමයට පත් කළ රාත්‍රියකි. ඒ ප්‍රීතිය, සතුට අත්දුටු අය දෙවියන් වහන්සේට ප්‍රශංසාවේ යෙදුනු රාත්‍රියකි.

අනුරාධපුර පදවි රදගුරු තුමාගේ දේශනය තුළ දෙවියන් වහන්සේගේ වචනය ද, කැමැත්ත ද ගැන කථා කරමින් අප හදවත් දෙවියන් වහන්සේ වෙතට ඔසවනු ලැබූ අතර එදින රාත්‍රි දිව්‍ය පූජාවේ දේශනය තුළ ගරු ඇලෙක්ස් නිලන්ත පියතුමා ශුද්ධාත්ම ගින්නට හසුවූවකු ලෙස දැරිය යුතු සාක්ෂිය ගැන අප සැම අවදි කරන ලදී.

* මුළු ගැළවීමේ ඉතිහාසය තුළම දෙවියන් වහන්සේගේ තෝරාගත් ජනතාව තුළ මේ ගින්න අවුළුවා දේව හඬට සවන් දීමේ, දේව කැමැත්ත ඉටුකිරීමේ ආශිර්වාදය ඔවුන් අත් දුටුහ. නමුත් විටින් විට දේව සිතට අනුකූල නොවන, දේව කැමැත්තට පිටුපා ක්‍රියා කරන ජන කොටස් බිහි විය. එය එසේ වුවද දෙවියන් වහන්සේ යුගයෙන් යුගය විවිධ පුද්ගලයන් තෝරා ගනිමින් ඔවුන් තුළ මේ ගින්න ඇවිලෙන්නට සලස්වන ලදී. විවිධ අවස්ථාවන්වල මේ ගින්න නිවීගෙන යද්දී එය සදා නොනිවෙන ගින්නක් බවට පත් කරන්නට භාග්‍යවන්ත අම්මා තුළ දෙවියන් වහන්සේ මේ ගින්න අවුලනු ලැබූ සේක. ඒ ගින්නෙන් ඇවිළුනු භාග්‍යවන්ත අම්මා කිසි දිනෙක නොනිවෙන සේ එය පවත්වා ගෙන යන්නට අවදියෙන් සිටියාය.
* ජේසු සමිඳාණන් තුළ ඇවිළුනු ශුද්ධාත්ම ගින්න මරණයටත් නිවෙන්නට බැරි තරම් ප්‍රබල වූවක් විය.
* පිබිදුනු කිතුනුවන් ලෙස අප ලබා ඇති ශුද්ධාත්ම ස්නාපනයද අප හදවත් තුළ ගිනි අවුලා ඇත්තේ කිසි දිනක නොනිවෙන ලෙස ශුද්ධාත්ම ගින්නෙන් දැල්වෙන්නටය.
* යුගයේ දිවැසිවර කාර්යය ඉටු කිරීමේ ගින්නෙන් දැවුනු ස්වාමි තාත්තා අද දක්වාම දෙවියන් වහන්සේ දුන් ජීවිත ක්‍රමය තුළ ජීවත් වන්නේ කිසිදා නොනිවෙන ශුද්ධාත්ම ගින්නට හසු වූ කෙනෙකු ලෙසය.
* පුබුදු ජනතාවක් ලෙස අපට ලැබී ඇති කැඳවීමද එයය. එය ඉතාම විශේෂිත වූ කැඳවීමකි. මුළු ශුද්ධවූ සභාව තුළ මේ ගින්නෙන් ඇවිලෙන්නට සිය දහස් ගණන් ජනතාව බලාගෙන සිටි නමුත් දෙවියන් වහන්සේ ඔබව / මාව තෝරා ගත්තා ඒ ගින්නෙන් ඇවිළෙමින් අන් අයව අවුළුවන්නට.

05. සාකච්ඡාව සඳහා : (4 දෙනාගේ පුංචි සංඝයන් ලෙස)

i අවංකවම අපි අපේ ජීවිත දෙසට එබී බලද්දී අපට කියන්නට පුලුවන්ද ඔබත් / මමත් ශුද්ධාත්ම ගින්නෙන් ඇවිළුනු කෙනෙකු ලෙස සාක්ෂි දරන්නෙක් කියලා.

ii දේව වචනය දේශනා කිරීම, අනිත් අයට මඟ පෙන්වීම, ඉගැන්වීම් දීම තුළ පමණක්ම අප තුළ ඇවිළුනු ශුද්ධාත්ම ගින්න ප්‍රකාශ වීම පිබිදුනු කිතුනුවෙකු ලෙස සෑහීමට පත්විය හැකි තත්ත්වයක් නොවේ. එදිනෙදා ජීවිතයේ අප ගත කරන ජීවිත ක්‍රමය තුළ, ජීවිත පැවැත්ම තුළ එය ප්‍රකාශ විය යුතුය. මගේ ක්‍රියාව, හැසිරීම, ප්‍රතිචාරය තුළ මා තුළ වැඩ වසන ශුද්ධාත්මයාණන්ගේ ක්‍රියාකාරීත්වය අන් අය දැකිය යුතුය. මා එවැනි සාක්ෂි කරුවෙක්ද?

06. අවසාන ප්‍රශංසාව :

පුබුදු ගී අංක 49 "යන්න සැරසෙමු...."

හතර දෙනාගේ පුංචි කණ්ඩායම් ලෙස සැකසෙමින් එකිනෙකා වෙනුවෙන් යාච්ඤා කරමු. දෙවියන් වහන්සේ අප තුළ අවුලා ඇති ශුද්ධාත්ම ගින්න කිසි දිනක නොනිවෙන ගින්නක් සේ දල්වා ගැනීමේ බලය පතා යාච්ඤා කරමු.

****************************

අවධානය සඳහා :

* ජූලි මස 07 වන සෙනසුරාදා පෙ.ව.09.00 සිට 08 වන ඉරිදා දිවා ආහාරය දක්වා විවාහ අපේක්ෂක සමුළුව ශ්‍රී ප්‍රශංසාරාමයේදී පැවැත්වේ. වැඩි විස්තර දැන ගැනීමට අවශ්‍ය නම් පහත සඳහන් දුරකථන අංකයට අමතන්න.
  මරින් තාත්තා - 075-6079906

* සුරැඳි වාර්ෂික දිනය පෙ.ව.09.30 - ප.ව.04.00 දක්වා ශ්‍රී ප්‍රශංසාරාමයේදී.